අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம்
State Ministry of Dhamma Schools, Parivenas & Bhikku Education

ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / இசுருபாய, பத்தரமுல்ல, இலங்கை / Isurupaya, Battaramulla, Sri Lanka
011 278 5141 | 011 278 5617 | info.dpb@moe.gov.lk | www.dpb.moe.gov.lk

ගරු රාජ්‍ය අමාත්‍යතුමා / Hon. State Minister / கௌரவ இராஜாங்க அமைச்சர் — 011 278 4836 | 011 278 4185 | minister.dpb.@moe.gov.lk

ලේකම් / Secretary / செயலாளர் — 011 278 6418 | 011 278 5617 | secretary.dpb@moe.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: ED/ST/BUD/8/2/2/1/1 | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2022.03.07 |

සියලු ම මූලික සහ මහ පිරිවෙන්වල පරිවේණාධිපතීන් වහන්සේලා හා
සියලු ම බෞද්ධ සීල මාතා අධ්‍යාපන ආයතනයන්හි ආයතනාධිපති සීලමාතාවන් වෙත.

## මූලික පිරිවෙන් 1 - 5 ශ්‍රේණි වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)

මූලික පිරිවෙන් පන්ති සඳහා 2021 වර්ෂාවසාන පරීක්ෂණය 2022.03.24 වෙනි බ්‍රහස්පතින්දා දින ආරම්භ කොට 2022.04.05 වෙනි අඟහරුවාදා දින අවසන් කිරීමට නියමිත අතර 1-5 ශ්‍රේණිවල සියලු ම ප්‍රශ්න පත්‍ර අමාත්‍යාංශ මට්ටමින් මුද්‍රණය කර පිරිවෙන්වලට බෙදාහැරීමට කටයුතු කෙරෙනු ඇත.

02. එක් එක් විෂයයන්වල විභාග කටයුතු අවසන් වූ වහාම පිළිතුරු පත්‍ර ඇගයුම් කොට 2022.04.06 හා 07 යන දිනවල විභාගය පැවැත්වූ අනුපිළිවෙලට පන්ති මට්ටමින් සිසුන් සමග පිළිතුරු පත්‍ර පිළිබඳ සමාලෝචනයක යෙදිය යුතු අතර ප්‍රතිඵල ලබා දී 2022.04.08 වෙනි සිකුරාදා දින නිවාඩු ලබා දීමට කටයුතු කළ යුතු ය. 2022 වර්ෂයේ පළමු අධ්‍යයන වාරය සඳහා 2022.04.21 දින නැවත පිරිවෙන් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු ය.

03. මහ පිරිවෙන්වල 12-13 ශ්‍රේණි හා ප්‍රාචීන පන්තිවල ද විද්‍යායතන පිරිවෙන්වල 6-13 ශ්‍රේණි හා ප්‍රාචීන පන්තිවල ද සුදුසු පරිදි විභාගය පැවැත්වීමට කටයුතු සිදු කළ යුතු ය.

04. Covid - 19 වසංගත රෝග ව්‍යාප්තියේ අවදානම තවදුරටත් පවතින හෙයින් වඩාත් විධිමත් හා නිවැරදි සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කළ යුතු ය.

05. දැනට ඉගැන්වීමේ කාලය කුමන වරුවක සිදු වුව ද කාලසටහනේ පරිදි නියමිත වේලාවට විභාග පැවැත්විය යුතු ය. පරිවේණාධිපතීන් වහන්සේ / ආයතනාධිපති මෑණියන් වහන්සේ විභාග ශාලාධිපති ලෙස ද, නියෝජ්‍ය පරිවේණාධිපතීන් වහන්සේ / නියෝජ්‍ය ආයතනාධිපති මෑණියන් වහන්සේ අතිරේක ශාලාධිපති ලෙස ද, ගුරු භවතුන් නිරීක්ෂකයන් වශයෙන් ද විභාග රාජකාරීවල යෙදෙමින් පෙර වර්ෂවල මෙන් ම මෙවර ද වාර පරීක්ෂණ කටයුතු විධිමත් ව පැවැත්විය යුතු ය.

06. ප්‍රශ්න පත්‍ර අඩංගු කවර විවෘත කිරීම නියමිත වේලාවට මිනිත්තු 05 කට පෙර නිරීක්ෂකයන් ඉදිරියේ සිදු කළ යුතු අතර ඒ දක්වා ප්‍රශ්න පත්‍ර සුරැකි ව තබා ගැනීම පරිවේණාධිපතීන් වහන්සේගේ / ආයතනාධිපති සීලමාතාවන්ගේ වගකීම වන්නේ ය. ඒ අතරතුර පැමිණෙන නිලධාරීන්ට ඒවා පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතු ය.

07. ශිෂ්‍යයන්ට විභාග අංක ලබා දී විභාග අංක පමණක් පිළිතුරු පත්‍රවල ලිවීමට උපදෙස් දිය යුතු ය. විභාග ලකුණු ලැයිස්තු සකස් කොට පිරිවෙන් කොට්ඨාස භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේට 2022.04.21 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. ලකුණු විශ්ලේෂණ වාර්තාව පිළිබඳ ව ගුරු මණ්ඩලය සමග අනිවාර්යයෙන් ම සාකච්ඡා කොට ලොග් සටහනක් තැබිය යුතු ය.


08. විභාගය පැවැත්වීමෙන් පසුව ශ්‍රේණිය අනුව එක් එක් ශිෂ්‍යයාගේ ලකුණු ලේඛනගත කළ යුතු ය. පිරිවෙනට සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) ස්වාමීන් වහන්සේ පැමිණි පසු ව අදාළ ලේඛනයට අනුමැතිය ලබා ගත යුතු ය.

09. විභාගය පිළිබඳ ව ගැටලු හෝ සංවර්ධනාත්මක යෝජනා වේ නම් වර්ෂාවසාන විභාග කමිටුව වෙත යොමු කරනු මැනවි.

10. මෙම විභාගය නීතිරීතිවලට අනුකූල ව පැවැත්වීම සඳහා ඔබ වහන්සේගේ සහ ආචාර්ය මණ්ඩලයේ කැපවීම අපේක්ෂා කරමි. පිරිවෙන් සිසුන් රජය මගින් පවත්වනු ලබන විභාගවල දී විභාග අක්‍රමිකතාවල යෙදෙන බවට තොරතුරු ලැබී ඇති බැවින් විභාග නීතිරීතිවලට ගරු කරමින් විභාගයට පෙනී සිටින්නේ කෙසේ ද යන්න පූර්වාදර්ශයක් වන පරිදි මෙම විභාගය පැවැත්වීමට කටයුතු කළ යුතු ය.

11. 5 ශ්‍රේණිය භූගෝල විද්‍යා සිතියම් අධ්‍යයනයට සම්බන්ධ ප්‍රශ්නය සඳහා ලබා දී ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් වර්ණ පිටපතක් බැවින් එයම ලබා දීමට කටයුතු කරන්න.

අත්/කළේ,



පූජ්‍ය කන්තලේ විජිතවංස හිමි
අධ්‍යක්ෂ (සංවර්ධන)

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන
රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත්:

01. අතිරේක ලේකම් (සංවර්ධන), දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
02. සියලු ම අංශ ප්‍රධාන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
03. සියලු ම පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
04. සියලු ම කොට්ඨාස භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
05. සියලු ම විෂය සහකාර අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන් හා මහත්වරුන්
06. සියලු ම විෂය භාර ගුරු උපදේශක හිමිවරුන් හා මහත්වරුන්
07. ගොනුවට

# අධ්‍යාපන අමාත්‍යාංශය - දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

## මූලික පිරිවෙන් 1 - 5 ශ්‍රේණි වර්ෂාවසාන පරීක්ෂණය 2021 (2022)

## කාලසටහන

| දිනය | ශ්‍රේණිය හා විෂය | වේලාව | වසර / විෂයය | වේලාව |
|---|---|---|---|---|
| 2022.03.24<br>බ්‍රහස්පතින්දා | 4, 5 ශ්‍රේණි ත්‍රිපිටක ධර්මය-I පත්‍රය | පෙ.ව 8.30 සිට 9.30 දක්වා | 4, 5 ශ්‍රේණි ත්‍රිපිටක ධර්මය-II පත්‍රය<br>1, 2, 3 ත්‍රිපිටක ධර්මය | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.03.25<br>සිකුරාදා | 4, 5 ශ්‍රේණි සිංහල - II පත්‍රය | පෙ.ව 8.30 සිට 10.30 දක්වා | 4, 5 ශ්‍රේණි සිංහල - I පත්‍රය<br>1, 2, 3 සිංහල | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.03.28<br>සඳුදා | 4, 5 ශ්‍රේණි පාලි - I පත්‍රය | පෙ.ව 8.30 සිට 9.30 දක්වා | 4, 5 ශ්‍රේණි පාලි - II පත්‍රය<br>1, 2, 3 පාලි | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.03.29<br>අඟහරුවාදා | 4, 5 ශ්‍රේණි සංස්කෘත - I පත්‍රය | පෙ.ව 8.30 සිට 9.30 දක්වා | 4, 5 ශ්‍රේණි සංස්කෘත - II පත්‍රය<br>1, 2, 3 සංස්කෘත | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.03.30<br>බදාදා | 4, 5 ශ්‍රේණි ගණිතය - I පත්‍රය | පෙ.ව 8.30 සිට 9.30 දක්වා | 4, 5 ශ්‍රේණි ගණිතය - II පත්‍රය<br>1, 2, 3 ගණිතය | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.03.31<br>බ්‍රහස්පතින්දා | 3, 4, 5 ශ්‍රේණි සමාජ විද්‍යාව | පෙ.ව 8.30 සිට 11.30 දක්වා | 1, 2, 3, 4, 5 ශ්‍රේණි ඉංග්‍රීසි | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.04.01<br>සිකුරාදා | 3, 4, 5 ශ්‍රේණි ඉතිහාසය | පෙ.ව 8.30 සිට 11.30 දක්වා | 3, 4, 5 ශ්‍රේණි සාමාන්‍ය විද්‍යාව | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.04.04<br>සඳුදා | 3, 4, 5 ශ්‍රේණි සෞඛ්‍ය විද්‍යාව | පෙ.ව 8.30 සිට 11.30 දක්වා | 3, 4, 5 ශ්‍රේණි භූගෝල විද්‍යාව | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.04.05<br>අඟහරුවාදා | | | 1, 2, 3, 4, 5 ශ්‍රේණි දෙමළ | ප.ව. 01.30 සිට 04.30 දක්වා |
| 2022.04.06 බදාදා දින සිට 2022.04.08 සිකුරාදා දින දක්වා | | | පිළිතුරු ඇගයීම, සමාලෝචනය හා ලකුණු ප්‍රදානය | |

**සැ.යු:**

- පිරිවෙනෙහි ඉගැන්වීම් කටයුතු දවසේ කුමන වරුවක සිදු වුව ද වර්ෂාවසාන විභාගය ඉහත කාල සටහනට අනුව පැවැත්විය යුතු ය.
- 1 සහ 2 ශ්‍රේණි සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීම සඳහා වෙන් කෙරෙන කාලය පැය දෙකකි.

අත්/කළේ,

පූජ්‍ය කන්තලේ විජිතවංස හිමි
අධ්‍යක්ෂ (සංවර්ධන)

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)

දිනය : 2022.03.07